සියලු ම හිමිකම් ඇවිරිණි] All Rights Reserved]

කළුතර අධ්‍යාපන කලාපය - ප්‍රාථමික අධ්‍යාපන ඒකකය

සිසු ප්‍රභා - පෙබරවාරි
5 ශ්‍රේණිය - 2025

මෙය විභාගයක් නොවන අතර දරුවන්ගේ සාධන මට්ටම පරීක්ෂා කිරීම සඳහා පමණි.

කළුතර අධ්‍යාපන කලාපයේ අවසරයකින් තොරව ''සිසු ප්‍රභා'' ප්‍රශ්න පත්‍රයේ කොටස් උපුටා ගැනීම හෝ අලෙවි කිරීම සපුරා තහනම් වේ.

I පත්‍රය

පැය එකයි.

විභාග අංකය:.....

විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්

- ඔබේ **විභාග අංකය** මේ කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- **තුන්වන පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- පිළිතුරු තුනක් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක්** අඳින්න.
- පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටු වැඩ කිරීම සඳහා කඩදාසි කොළයක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි

පිටු අංකය	ලැබූ ලකුණු
02	
03	
04	
05	
06	
07	
08	
එකතුව	
අවසාන ලකුණ :	
ඉලක්කමෙන්	
අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටියට අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බවට සහතික කරමි.	
	V/II/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි.	
	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි.	
	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදිය	
	V/II/S/CH

★ ප්‍රශ්න අංක 1 සිට 40 තෙක් දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

● කවිවලින් විස්තර කෙරෙන සතුන් තෝරා ඉරක් අඳින්න.

01.


ගේ අද්දර උදුපියලිය පඳුරට	වීලා
දිගු කන් දෙක එහෙට මෙහෙට සැම	පද්දාලා
පුලුන් ගොඩක් තැබුවාසේ එකට ගුලි	වෙලා
අපට බයද දුව යන්නේ බැල්ම	හෙළාලා



(1) (2) (3)


02.

ගාට ගාට හෙමින් සැරේ ගමනක්	යන්නේ
එළවළු කොරටුවෙ පල දලු රැටයි	කන්නේ
බය වුණාම අකුළා ගේ ඇතුළට	යන්නේ
කෙළ පිඩ පිඩ යන පාරේ ගාගෙන	යන්නේ



(1) (2) (3)


● පහත කොටු තුළ ඇති රූප නිරීක්ෂණය කරන්න. එක් එක් රූපය සඳහා ඉංග්‍රීසි අකුරු යොදා ඇත. එම රූපවල හොඳම සම්බන්ධතාව දැක්වෙන පරිදි රූප යුගල කොට ඇති නිවැරදි පිළිතුර තෝරන්න



03. (1) A:C, D:F, B:H (2) B:H, C:E, D:F (3) A:G, B:H, D:E

● අංක 4 සහ 5 ප්‍රශ්නවල ඇති රූපයට වෙනස්කමක් කර ඇති රූපය තෝරන්න.

04.



(1) (2) (3)

විභාග අංකය:.....

05.



(1)





(2)



(3)

- ළමුන් තිදෙනෙකුගේ උස ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු පහත සංකේත හා රූප මගින් දක්වා ඇත.එම තොරතුරු ඇසුරු කර ගනිමින් අංක 6, හා 7 ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.

මිටියි < උසයි		
උසයි > මිටියි	නිදෙව් > දෙනෙත්	නිදෙව් < නෙහංස

06. මෙම ළමයින් තිදෙනාගෙන් උස ම ළමයා කවු ද?

(1) නිදෙව් (2) දෙනෙත් (3) නෙහංස

07. මෙම ළමයින් තිදෙනාගෙන් උස අඩු ම ළමයාගේ සිට උස වැඩිම ළමයා තෙක් පිළිවෙළින් දැක්වුව හොත් ලැබෙන නිවැරදි පිළිතුර කුමක් ද?

(1) දෙනෙත්,නිදෙව්,නෙහංස (2) නෙහංස,නිදෙව්,දෙනෙත් (3) දෙනෙත්,නෙහංස,නිදෙව්

- පහත කොටු ජාලය ඇසුරින් අංක 8, 9 හා 10 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

3	6	N	K	9	K	D	4	H	N	6	3	T	S	3

08. ඉහත කොටුවේ ඉලක්කමක් දෙපස එකම අක්ෂරයක් පිහිටා ඇත. එම අක්ෂරය කුමක් ද?

(1) K (2) S (3) N

09. මෙහි 3 ඉලක්කම පිහිටි අවස්ථා ගණන කීය ද?

(1) 1 (2) 2 (3) 3

10. මෙහි ඇති සියලුම ඉලක්කම්වල එකතුව කීය ද?

(1) 34 (2) 30 (3) 29

- 5 ශ්‍රේණියේ සිසුන් හතර දෙනෙකු වාර පරීක්ෂණයක දී ලබාගත් ලකුණු පිළිබඳ විස්තරයක් පහත වගුවේ දැක්වේ.

විෂය	සුපුන්	අකිල	නයනි	මලිති
සිංහල	★	★	▲	★
ගණිතය	★	+	●	★
පරිසරය	+	+	★	▲
ඉංග්‍රීසි	★	★	●	●
ආගම	+	▲	●	▲


★ ඉතා හොඳයි.
\+ හොඳයි
▲ සාමාන්‍යයයි
● දුර්වලයි

11. මෙම සිසුන් අතරින් දක්ෂතම සිසුවා කවුරුන් ද?
(1) සුපුන් (2) නයනි (3) අකිල

12. මෙම සිසුන් අතරින් දුර්වල මට්ටමේ සිටින සිසුවා කවුරුන් ද?
(1) මලිති (2) අකිල (3) නයනි

13. පානදුර බස් නැවතුම්පළින් සෑම මිනිත්තු 20 ට වරක් කොළඹ බලා බස් රථයක් ද,සෑම මිනිත්තු 30 ට වරක් රත්නපුරය බලා බස් රථයක් ද පිටත් වෙයි.මෙම බස් රථ දෙක ම පෙරවරු 8.00 ට පිටත් ව ගියේ නම් නැවත බස් රථ දෙක ම එකවර පිටත්වන වේලාවක් වන්නේ,
(1) පෙ.ව.8.30 (2) පෙ.ව.9.30 (3) පෙ.ව.10.00

14. රූපයේ A B C යන සමචතුරස්‍ර තුන එකිනෙකට සමාන ය. එහි අඳුරු කළ කොටසේ අගය 10ක් නම් මුළු රූපයේ ම අගය කීය ද?



(1) 60
(2) 90
(3) 40

- පහත දී ඇත්තේ නගරයක වෙළෙඳ සැල් පිහිටා ඇති ආකාරය දැක්වෙන සැලැස්මකි. ඒ ඇසුරින් අංක 15 සහ 16 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

නගරය			
1 සුපුන් විදුලි උපකරණ වෙළෙන්දෝ	2 සරත් රෙදි පිළි වෙළෙන්දෝ	3 ගොඩනැගිලි තීන්ත වෙළෙඳ සැල	4 නිමල් ගල් වැලි සපයන්නෝ

15. රූපවාහිනියක් සහ සාරියක් මිල දී ගැනීමට යායුතු වෙළෙඳ සැල්වල අංක මොනවා ද?
(1) අංක 3 සහ අංක 2 (2) අංක 1 සහ අංක 2 (3) අංක 3 සහ අංක 1

16. ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමට යායුතු වෙළඳසැල්වල අංක වන්නේ,
(1) අංක 1 සහ අංක 3 (2) අංක 3 සහ අංක 4 (3) අංක 2 සහ අංක 4

17. ලිතුනිගේ දූරකථන අංකයේ ඉලක්කම් 10 යේ එකතුව 57කි. එහි මුල් ඉලක්කම් අට 071 84796 වේ. අවසාන ඉලක්කම් දෙක තිබිය හැකි ආකාර කීයක් තිබේ ද?
(1) 9 (2) 15 (3) 4

18. දිග 4 cm ක් ද,පළල 4 cm,උස 4 cm ක් ද වන ඝනක හැඩති ලී කුට්ටියකින් දිග 1 cm ක් ද,පළල 1 cm, උස 1 cm ක් වන කුඩා ඝනකවලට කපා වෙන් කළේ නම් එසේ වෙන් වන කුඩා ඝනක ගණන කීය ද?
(1) 12 (2) 64 (3) 24

19. පොතක හරි මැද පෙරලූ විට දෙපස පිටු අංකවල එකතුව 41ක් විය. පොතේ පිටු කීයක් තිබේ ද?
(1) 40 (2) 45 (3) 36

20. මිනිසෙක් A ස්ථානයේ සිට මීටර 30ක් නැගෙනහිරට ගොස් නැවත උතුරු දෙසට හැරී මීටර 120ක් ගොස් තමාගේ වම් අත පැත්තට හැරී මීටර 120ක් ගොස් නතර විය. දැන් ඔහු සිටින්නේ A සිට කුමන දිශාවෙන් ද?
(1) වයඹ (2) උතුර (3) බස්නාහිර

21. සමන් පාසල් උපකරණ ගැනීමට වෙළෙඳසැලකට ගිය විට වෙළෙන්දෙක් මෙසේ පැවැසුවේ ය. ''මහත්තය, පිටු 80 තනිරූල් පොතයි පැන්සලයි රු.100.00 ක් වෙනවා.පැන්සලයි කවකටු පෙට්ටියයි රු.160.00කට දෙන්න පුළුවන්.'' පිටු 80 තනිරූල් පොත් එකයි, පැන්සල් දෙකයි, කවකටු පෙට්ටි එකයි, මිල දී ගැනීමට සමන්ට වැයවන මුදල කීය ද?

(1) රුපියල් 360 (2) රුපියල් 260 (3) රුපියල් 180

22. ශිෂ්‍යත්ව විභාගයෙන් තමා ඉහළින් ම සමත් වන බව සුපුන් කියයි. ඔහු එසේ කියන්නේ

(1) 2024 ශිෂ්‍යත්ව විභාගය අමාරු වූ නිසා මෙවර ප්‍රශ්න පත්‍රය සරලව සාදයි යන විස්වාසය නිසා

(2) සතියේ දවස් හත ම අතිරේක පන්තිවලට සහභාගිවන නිසා.

(3) සුපුන් විභාගයට හොඳින් සූදානම් වී ඇති නිසා විය යුතු ය.

23. අප දිනපතා පාසල් ගොස් හොඳින් ඉගෙන ගත යුතු ය. එයට හේතුව

(1) රජයෙන් නිල ඇඳුම් පාසල් පෙළ පොත් නොමිලයේ ලබා දෙන නිසා

(2) රටට වැඩදායි පුරවැසියෙකු වීමට නම් හොඳින් ඉගෙන ගත යුතු ය.

(3) පාසලේ දී මිතුරන් සමග සෙල්ලම් කිරීමට හැකිවන නිසා

- අංක 24 හා 25 ප්‍රශ්නවල කොටුවේ ඇති අගයන්ට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඉරක් අඳින්න.

24. $20 \text{ X } 4 = \boxed{40+40}$

(1) $90 \div 2$ (2) $5 + 16$ (3) $5 \text{ x } 16$

25. $80 + 20 = \boxed{25 \text{ x } 4}$

(1) $100 \div 2$ (2) $81 + 19$ (3) $50 \text{ x } 4$

- පහත කොටු තුළ ඇති වාක්‍යවල එක් එක් වචනය සඳහා රූපයක් බැගින් යොදා තිබේ. නමුත් එම රූප ඇත්තේ වචන පිළිවෙළට නොවේ.එය තේරුම් ගෙන පිළිතුරු සපයන්න.

මල්ලී මල් කඩයි.	
නංගී මල් පූජා කරයි.	
මල්ලී පොත් කියවයි.	
වෙළෙන්දිය මල් විකුණයි.	

26. මල් යන වචනයට ගැළපෙන රූපය කුමක් ද?

(1)  (2)  (3) 

27. මල්ලී යන වචනයට ගැළපෙන රූපය කුමක් ද?

(1)  (2)  (3) 

28. පහත කොටුවේ ඇති අකුරුවල නොගැළපෙන අකුර කුමක් ද?

ව	ප	ය	ෂ	ක	ඝ	ත	ස	න

(1) ව (2) ෂ (3) ක

29. පහත වචන අතර නොගැළපෙන වචන යුගලය වන්නේ,


ගෙවල් - දොරවල් , යාන - වාහන , රාත්‍රිය - රැය , කෙළි - සෙල්ලම් , වතු - පිටි

(1) යාන - වාහන (2) රාත්‍රිය - රැය (3) ගෙවල් - දොරවල්

30. එක්තරා සමිතියක සාමාජිකයෝ 11 දෙනෙක් සිටිති. ඔවුහු සෑම මාසයකම පිළිවෙළින් එක් එක් සාමාජිකයාගේ නිවසට රැස් වෙති. සුදර්ශන මහතාගේ නිවසේ රැස්වීම පැවතියේ පසුගිය මැයි මාසයේ දීය. සුදර්ශන මහතාගේ නිවසේ මීළඟ රැස්වීම පැවැත්වෙන්නේ කවර මාසයේ ද?

(1) ජුනි (2) මැයි (3) අප්‍රේල්

31. පහත දැක්වෙන ඝනකයේ සියලුම මුහුණත්වල අගයන්ගේ එකතුව 42කි. එහි නොපෙනෙන පැතිවල තිබිය හැකි සංඛ්‍යා විය හැක්කේ,



(1) 2 , 6 , 10 (2) 9 , 6 , 7 (3) 3 , 6 , 10

32. 5 ශ්‍රේණියේ වාර විභාගය බ්‍රහස්පතින්දා දිනයක ආරම්භ විය. එය දින 4කින් අවසන් කළ යුතු බව විදුහල්පතිතුමා විසින් දන්වන ලදී. සිකුරාදා පොහොය දිනයකි. ඒ අනුව විභාගය අවසන් වන දවස කුමක් ද?

(1) අඟහරුවාදා (2) සඳුදා (3) බදාදා

33. අවුරුද්දේ දින 31න් අවසන් වන මාසවල දිනවල එකතුව කොපමණ ද?

(1) 217 (2) 218 (3) 221

34. සඳසි,ලිතුනි කුඩා කල පටන් ම එකට හැදුණු වැඩුණු යෙහෙළියන් දෙදෙනෙකි. පාසලේ දී ඔවුන් දෙදෙනාම එකට ම සිටිති. සඳසි කොතන ද ලිතුනි එතනය ලිතුනි කොතන ද සඳසි එතන ය. මෙම මිතුදම හොඳින් නිරූපණය කරන ප්‍රකාශය තෝරන්න.


(1) රයිගමයයි ගම්පළයයි වගේ

(2) ඉදිකටුවයි නූලයි වගේ

(3) වැල යන පැත්තට මැස්ස ගහන්නා වගේ


● අංක 35 සහ 36 ප්‍රශ්නවල දැක්වෙන සංඛ්‍යා රටාව තේරුම් ගෙන හිස් තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.

35.




(1) 42 (2) 35 (3) 30

36.



(1) 55 (2) 45 (3) 47

37. සෘජුකෝණාස්‍ර තහඩුවක අඳුරු කර ඇති කොටස කපා ඉවත් කරන ලදී එවිට ඉතිරිවන කොටසේ වටේ දිග මුලින් තිබූ තහඩුවේ වටේ දිගට



(1) වඩා අඩු ය.
(2) සමාන ය.
(3) වඩා වැඩි වේ.

38. දසුල 2024 පෙබරවාරි 25වන දා සිට මාර්තු 01වන දා තෙක් දිනපතා දළඳා මාලිගාවේ ඇති පිං කැටයට රුපියල් 2 කාසියක් හා රුපියල් 10 කාසියක් දැම්මේ ය. ඔහු විසින් එම දින කිහිපයේ දී දැමූ මුළු මුදල කීය ද?

(1) රුපියල් 72.00 (2) රුපියල් 60.00 (3) රුපියල් 80.00

39. වෛද්‍යවරයෙකු රෝගියෙකුට බෙහෙත් පෙති 4ක් දී එය පානය කිරීමට නියම කරනු ලැබුවේ පැයෙන් පැයට එක දිගට පානය කළ යුතු බවයි.ඒ අනුව බෙහෙත් පෙති 4 පානය කර අවසන් කිරීමට පැය කීයක් ගත වේ ද?

(1) පැය 4 (2) පැය 3 (3) පැය 5

40. අඹ ගසක කුරුල්ලෝ සංඛ්‍යාවක් ඇත. ඉන් $\frac{3}{4}$ ක් ඉගිලී ගිය විට ඉතිරි වූ සංඛ්‍යාව 12ක් නම් අත්තේ මුළින් සිටි කුරුල්ලන් සංඛ්‍යාව කොපමණ ද?

(1) 48 (2) 16 (3) 9

සියලු ම හිමිකම් ඇවිරිණි] All Rights Reserved]

කළුතර අධ්‍යාපන කලාපය - ප්‍රාථමික අධ්‍යාපන ඒකකය

සිසු ප්‍රභා -පෙබරවාරි
5 ශ්‍රේණිය - 2025

මෙය විභාගයක් නොවන අතර දරුවන්ගේ සාධන මට්ටම පරීක්ෂා කිරීම සඳහා පමණි.

කළුතර අධ්‍යාපන කලාපයේ අවසරයකින් තොරව ''සිසු ප්‍රභා'' ප්‍රශ්න පත්‍රයේ කොටස් උපුටා ගැනීම හෝ අලෙවි කිරීම සපුරා තහනම් වේ.

II පත්‍රය

පැය එකයි. මිනිත්තු 15

විභාග අංකය:.....

විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්

- ඔබේ **විභාග අංකය** මේ කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- **තුන්වන පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- පිළිතුරු තුනක් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර** තෝරා යටින් **ඉරක්** අඳින්න.
- පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටු වැඩ කිරීම සඳහා කඩදාසි කොළයක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි

පිටු අංකය	ලැබූ ලකුණු
02	
03	
04	
05	
06	
07	
08	
එකතුව	
අවසාන ලකුණ :	
ඉලක්කමෙන්	
අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටියට අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බවට සහතික කරමි.	
	V/II/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි.	
	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි.	
	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදිය	
	V/II/S/CH

(01) **පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ඡේදයෙන් තෝරා ලියන්න.**

නෙලුම්බණ්ඩාර සුනිල්ගේ අප්පච්චී,උසාවි කාර්යාලයේ ප්‍රධාන ලිපිකරු ය. ඔහු කන්තෝරු යන්නේ කාරයෙනි. ඒ යන විට සුනිල් හා ඔහුගේ අක්කා වන මෛත්‍රීත් කැටුව යයි. ඈ ආපසු එන්නේ ද අප්පච්චී සමඟ ය. ඇගේ පාසලට උසාවි වේලාව බොහෝ දුරට ගැළපේ. නමුත් ගැමුණු විද්‍යාලය එක හමාරට ඇරෙන නිසා සුනිල් ආපසු එන්නේ පයින් ය.

අඹ යහළුවෝ -ටී.බී.ඉලංගරත්න මහතා

(i) සුනිල්ගේ අප්පච්චිගේ නම කුමක් ද ? .....

(ii) සුනිල්ගේ පියාගේ රැකියාව කුමක් ද?

.....

(iii) 'ඒ' ශබ්දයෙන් ආරම්භවන වචනයක් ඡේදයෙන් තෝරා ලියන්න. .....

(iv) 'ඇය' යන පදයේ පුරුෂ ලිංග පදය ඡේදයෙන් තෝරා ලියන්න.. .....

(v) මෙහි දැක්වෙන ඒකවචන ක්‍රියා පදයක් ලියන්න. .....

(vi) සුනිල්ගේ පාසල අවසන්වන වේලාව කුමක් ද? .....

(ලකුණු 6)

(02) ද්‍රව්‍ය නාම පදය තෝරා යටින් ඉරක් අඳින්න.

ගවයා / තොප්පිය / පැල / කාර්යාලය

(03) පහත සඳහන් වාක්‍ය ලිඛිත බසට හරවන්න.

- මී මැස්සෝ සමගියෙන් ජීවත් වෙනවා.

.....

(04) (i) පහත සඳහන් ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ කරන්න.

- ඉඟුරු දීලා ..... ගත්තා වගේ

(ii) යුගල පදය සම්පූර්ණ කරන්න.

- ගෙවල් .....

(05) වචන ගළපා නිවැරදි වාක්‍යයක් ගොඩනගන්න.

- පැමිණියේ ය / වනාන්තරයේ / ගැල් / කෙළවරට / කණ්ඩායම

(ලකුණු 5)

.....

(06) අක්ෂර වින්‍යාසය අනුව නිවැරදි වචනය තෝරන්න.

(i) විද්‍යාලය / පෝෂනය / සන්ග්‍රහය

(ii) ග්‍රන්තය / ප්‍රශංසා / ප්‍රමානය

(07) <u>රූ</u>පය යන වචනයේ ඉරි ඇඳි අකුරට යෙදී ඇති පිල්ලම හඳුන්වන නම ලියන්න.

.....

(08) (i) සමානාර්ථ පදය ලියන්න.

තරු - .....

(ii) විරුද්ධාර්ථ පදය ලියන්න.

ඉහළ - .....

(09) පහත සඳහන් වාක්‍යවලට ගැළපෙන ක්‍රියාපදය වරහන් තුළින් තෝරා ඉරක් අඳින්න.

(i) අයියා ද මල්ලී ද සරුංගල් ..... (යවයි / යවති)

(ii) මහ සුළඟට ගස් ඉදිරී ..... (වැටෙති / වැටෙයි)

(iii) මුවදෙන පැටියාට කිරි ..... (දුන්නේ ය / දුන්නා ය)

(iv) සොරු ගෙවල් බිඳ බඩු පැහැර ..... (ගත්හ / ගත්තේ ය)

(10) (i) **අධික වර්ෂාව** යන අදහසට ගැළපෙන ඉඟි වැකිය ලියා දක්වන්න.

◆ .....

(ii) ගැළපෙන විරාම ලකුණු යොදන්න.

◆ නායක සිටුතුමනි මේ අඹ වර්ගය අනුභව කළාට වරදක් නැද්ද

(11) පහත සඳහන් තේරවිල්ලෙහි පිළිතුර ලියා දක්වන්න.

දාරත් නැති මුලුත් නොමැති

යන්නේ මම පෙරළි පෙරළි ..... (ලකුණු 12)

(12) (i) එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය **ඉංග්‍රීසි අකුරෙන් ම** ලියන්න.





(ii) ඉංග්‍රීසි වැකිවලට ගැළපෙන **සිංහල අර්ථය** ලියන්න.

- Let's sing a song - .....
- I will bring flowers. - .....

(iii) දී ඇති වචන ගළපා අර්ථවත් වැකියක් බැගින් සාදන්න.

- wash / our /shall / hands / we - .....
- am / school / I / to the / going- .....

(ලකුණු 6)

(13) පහත සඳහන් වැකිය දෙමළෙන් කියන ආකාරය **සිංහල අකුරෙන්** ලියන්න.

- ඔයාගේ පාසල කුමක් ද? - .....

(14) පහත සඳහන් දෙමළ වචනවල සිංහල අර්ථය ලියන්න.

- නාන් - ..... අම්මාමාර් - .....

(ලකුණු 3)

- **පහත ගණිත ගැටලු විසඳන්න.**

(15) 'විසිදහස් අට' ඉලක්කමෙන් ලියන්න. .....

(16) 9 0<u>8</u>6 යන සංඛ්‍යාවේ ඉරි ඇඳි ඉලක්කමේ ස්ථානීය අගය කීය ද? .....

(17) iv + v = ... හි පිළිතුර රෝම ඉලක්කමෙන් ලියන්න. .....

(18) පහත සඳහන් සංඛ්‍යා රටාවේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

1, 4, 9, ..., 25, ...

(19) එක් පැකට් එකක කිරිටොෆි කෑලි 25 බැගින් පැකට් 4 ක් ද කිරිටොපි කෑලි 50 බැගින් පැකට් 3 ක් ද ඇත. මෙහි ඇති මුළු කිරිටොෆි කෑලි ගණන කීය ද? .....

(20) කොළඹ සිට මාතර බලා යන දුම්රියක මගීහු 550 ක් සිටියහ. පානදුරෙන් 125 ක් දුම්රියෙන් බැස ගත් අතර තවත් 75 ක් දුම්රියට ගොඩ විය. දැන් දුම්රියේ සිටින මගීන් ගණන කීය ද?

.....

(21) සුළු කරන්න.

km	m
12	140
+10	950

(22) වෙළෙන්දෙක් තේ කුඩු 1kg ක් රු. 800.00කට මිල දී ගෙන ,එය නැවත රු.1 000.00 ට අලෙවි කරයි නම් , නැවත තේ කුඩු විකිණීමෙන් වෙළෙන්දා ලබන ලාභය කොපමණ ද?

රුපියල් .....


(23) සමන් මිලදී ගත් වට්ටක්කා ගෙඩියේ බර 3kg 450g කි. ඔහු මිලදී ගත් කොමඩු ගෙඩියේ බර 2kg 225g කි. ඒ අනුව ඔහු මිලදී ගත් කොමඩු ගෙඩියේ සහ වට්ටක්කා ගෙඩියේ මුළු බර කොපමණ ද?

.....kg .....g


(24) එක්තරා සාදයක් සඳහා බීම සාන්ද්‍රණයකින් $3l$ $500ml$ ක් හා ඒ සඳහා ජලය ලීටර 5ක් ද එක්කර බීම සකස් කර ගන්නා ලදී. ඒ අනුව සකස් කරන ලද මුළු බීම ප්‍රමාණය කොපමණ ද?

.....*l* .....*ml*

(25) පහත සඳහන් රූපයෙන් $\frac{1}{4}$ ක් අඳුරු කර දක්වන්න.



(26) පහත සඳහන් ඔරලෝසුවේ වේලාවට පැය දෙකකට පෙර වේලාව ලියන්න.



.....

(27) ගවුමක මිල රු.1250.00 කි.කමිසයක මිල රු.1475.00 කි.මෙම ද්‍රව්‍ය දෙකම මිල දී ගෙන රු.5000.00 ක නෝට්ටුවක් දුන් විට ලැබෙන ඉතිරි මුදල කොපමණ ද? .....

(28) තාත්තා වෙළඳ පොළට යාම සඳහා පෙ.ව. 9.00 ට නිවසින් පිටත් විය. ඔහු පැය 3 මිනිත්තු 30කට පසුව නැවත නිවසට පැමිණි යේ නම් නිවසට පැමිණි වේලාව ලියන්න.

.....

(29) පහත වගුව තුළ දැක්වෙන්නේ වෙළෙන්දෙක් දිනක් තුළ විකුණන ලද ආහාර වර්ගයන් පිළිබඳ තොරතුරු ය.

ආහාර වර්ගය	විකුණන පද ප්‍රමාණය
රෝල්ස්	25
වඩේ	70
බිත්තර රොටි	20
මාළු පාන්	18
බනිස්	30

(i) ඒ අනුව විකුණන ලද වඩේ හා මාළුපාන් ප්‍රමාණ අතර වෙනස කීයද? .....

(ii) විකුණන ලද මුළු ආහාර ප්‍රමාණය කොපමණ ද? .....

(ලකුණු 30)

- පහත ප්‍රශ්න කියවා එයට අදාළ පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(30) රාත්‍රී කාලයේ පරිසරයේ දක්නට ලැබෙන පක්ෂියෙක් නොවේ,
1. උලමා 2. බස්සා 3. කෑදැත්තා

(31) අහසේ දේදුන්නක් දැකිය හැකි වන්නේ,
1. හොඳින් හිරු එළිය ඇති විට 2. තද වැසි පවතින විට
3. මද වැස්ස සමග හිරුඑළිය ඇති විට

(32) රාත්‍රී කාලයේ පිපෙන මල් වර්ගයකි,
1. කඩුපුල් 2. අරලිය 3. සූරියකාන්ත

(33) අපට තොරතුරු ලබාදෙන මුද්‍රිත මාධ්‍යයකි,
1. ගුවන් විදුලිය 2. රූපවාහිනිය 3. සඟරාව

(34) අතීතයේදී භාවිත කරන ලද සන්නිවේදන ක්‍රමයක් නොවේ,
1. අණබෙර 2. සීපද 3. ටෙලිමේල්

(35) ''පැට්ටි අඬන්නේ මොන්නාට දෝ බොල'' යන ගීතය,
1. තේරවිලි ගීයකි. 2. රබන් පදයකි. 3. නැළවිලි ගීයකි.

(36) අපිරිසිදු ජලය පානය කිරීමෙන් ඇතිවන රෝගයකි.
1. සෙංගමාලය 2. හෘද රෝග 3. දියවැඩියාව

(37) බස්නාහිර පළාතට අයත් දිස්ත්‍රික්ක ගණන වන්නේ,
1. දෙකකි 2. තුනකි 3. පහකි

(38) ශ්‍රී ලංකාවේ මැණික් සඳහා ප්‍රසිද්ධ වන්නේ,
1. යාපනය 2. මාතර 3. රත්නපුර

(39) මින්නේරිය වැව කරවන ලද රජතුමා වනුයේ,
1. ධාතුසේන 2. මහසෙන් 3. දෙවනපෑතිස්

(40) පාරේ ගමන් කරන විට අනුගමනය කළ යුතු යහපත් පුරුද්දක් නොවේ,
1. පාරේ දකුණු පැත්තෙන් අයිනෙන් යාම. 2. රංචු වශයෙන් ගමන් කිරීම.
3. මාර්ග නීති රීති අනුගමනය කිරීම.

(41) 

මෙම රූපික ප්‍රකාශනයෙන් කියවෙන්නේ,
1. ආබාධිත අය සඳහා වෙන් කර ඇත.
2. ළමයින් සඳහා පමණි.
3. පැමිණි විගස පුටුවක හිඳගත යුතු බව.

(42) ප්‍රෝටීන් බහුල ශාකමය ආහාරයකි,

1. බිත්තර 2. යෝගට් 3. දඹල

(43) බස් රථයේ දැකිය හැකි දැන්වීමක් නොවේ,

1. පූජ්‍ය පක්ෂය සඳහා වෙන්කර ඇත. 2. ගැබිනි මාතාවන් සඳහා වෙන්කර ඇත.
3. වැඩිහිටියන් සඳහා වෙන්කර ඇත.

(44) පොදු ප්‍රවාහන සේවයක දැකිය හැකි ලක්ෂණයකි,

1. බඩු බාහිරාදිය ගෙන යා නොහැකි වීම. 2. අඩුවියදමින් ගමන් කළ හැකි වීම.
3. වැඩි දෙනෙකුට ගමන් කළ නොහැකි වීම.

(45) විද්‍යුත් චුම්බකයක් සෑදීමට අවශ්‍ය නොවන දෙයකි,

1. යකඩ ඇණයක් 2. වියළි කෝෂ 3. නූල්

(46) ලුණු කැටයක් ගින්දරට දැමූ විට,

1. දිය වේ 2. පුපුරා යයි 3. කිසිවක් සිදු නොවේ

(47) සීගිරිය බලකොටුව කරගත් රජතුමා වන්නේ,

1. මහසෙන් 2. කාශ්‍යප 3. වළගම්බා


(48) සහනශීලී චර්යාවක ලක්ෂණයකි,

1. ගැටුම් වැළකීම. 2. හොඳහිත පවත්වාගෙන යාමට නොහැකි වීම.
3. අන් අයගේ ගරුත්වයට හානි වීම.

(49) දකුණු පළාතට මායිම් වන පළාතක් වන්නේ,

1. නැගෙනහිර පළාත 2. උතුරු පළාත 3. වයඹ පළාත

(50)



මෙම සුළං දිශා දර්ශකයට අනුව සුළං හමා එන්නේ,

1. බස්නාහිර සිට නැගෙනහිරට දිශාවට
2. නැගෙනහිර සිට බස්නාහිරට දිශාවට
3. උතුරේ සිට දකුණු දිශාවට

(51) ජලය පිරිසිදු කර ගැනීමට යොදා ගන්නා රසායනික ද්‍රව්‍යයකි,

1. ඉඟිනි ඇට 2. අඟුරු 3. ක්ලෝරීන්

(52) සූර්යග්‍රහණයක් දැකිය හැකි වන්නේ,

1. පසළොස්වක පොහෝ දින 2. අමාවක පොහෝ දින 3. අටවක පොහෝ දින

(53) උදේ කාලයේ දේදුන්නක් දැකගත හැක්කේ,

1. බස්නාහිර අහසේ 2. නැගෙනහිර අහසේ 3. ඕනෑම පැත්තක

(54) E-01 ලෙස හඳුන්වන අධිවේගී මාර්ගය වන්නේ,

1. කොළඹ කටුනායක මාර්ගය
2. කොළඹ පිටත වටරවුම් අධිවේගී මාර්ගය
3. දක්ෂිණ අධිවේගී මාර්ගය

(55) ලිපි දැමීම සඳහා තබා ඇති තැපැල් පෙට්ටියක වර්ණයකි,

1. කළු
2. රතු
3. රෝස

(56) 

මෙම රූපයෙන් දැක්වෙන වීරවරයා හඳුන්වන්නේ,

1. ඩී.එස්. සේනානායක
2. ආචාර්ය ටී.බී. ජයා මැතිතුමා
3. ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මහතා

(57) චුම්බක සවිකර ඇති උපකරණයක් නොවේ,

1. ගිල්ලුම්තාපකය
2. කුඩා විදුලි මෝටරය
3. ශීතකරණය

(58) අතංගුව භාවිත කරනු ලබන්නේ,

1. පතල් කර්මාන්තය
2. කෘෂි කර්මාන්තය
3. ධීවර ර්මාන්තය

(59) පස් නියැදියක් ගෙන විනිවිද පෙනෙන බෝතලයකට දමා, එයට ජලය යොදා හොඳින් සොලවා පැයකට පමණ පසු නිරීක්ෂණය කළ විට එහි පතුලේ ම දැකිය හැක්කේ,

1. හියුමස්
2. බොරලු / ගල්කැට
3. රොන් මඩ

(ලකුණු 30)

(60) ''**මා කිය වූ හොඳම පොත**'' යන මාතෘකාව යටතේ අර්ථවත් වගන්ති 3 ක් ලියන්න. එක් වැකියක් වචන පහකට නොඅඩු විය යුතු ය.උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.

i. .....

.....

ii. .....

.....

iii. .....

.....

(ලකුණු 6)

(නිවැරදි හා පැහැදිලි අත් අකුරු සඳහා ලකුණු දෙකක් ලබා දෙන්න.)